# Trial monitoring reports related to high court cases regarding Easter attack.[1]

## Table of Contents


**A. Trial monitoring reports in case against 25 Accused**

**[Case No: -HC (TAB) 2972/21]**

a) 23rd November 2021……………………………………………………………….3

**B. Trial monitoring reports in case against former IGP**

**[Case No: -HC (TAB) 2900/21]**

a) 22nd November 2021……………………………………………………………......6

b) 23rd November 2021……………………………………………………………......8

c) 24th November 2021…………………………………………………………….....10

d) 25th November 2021…………………………………………………………….....13

e) 26th November 2021…………………………………………………………….....16

**C. Trial monitoring reports in case against former defense secretary**

**[Case No: -HC(TAB) 2899/21]**

a) 25th November 2021………………………………………………………………19

b) 26th November 2021………………………………………………………………22

c) 13th November 2021………………………………………………………………24

d) 14th November 2021………………………………………………………………26

e) 15th November 2021………………………………………………………………29


[1] CSR was not able to do in person trial monitoring in relation to case against the former IGP on 29th November and in relation to the case against the former defense secretary on 22nd, 23rd and 24th November 2021

# Trial monitoring reports in case against 25 Accused

# Case No: -HC (TAB) 2972/21

**Trial Monitoring report**

**About the case:** Easter attacks - case against 25 Accused

**Case no. :**HC (TAB) 2972/21

**Courts:** Colombo High Court No. 1, Trial at Bar

**Date of hearing:** 23/11/21

**Author (s) of report:** Centre for Society and Religion (CSR)

## 1. Who was in courts:

| Who | Names / other information | Comments |
|---|---|---|
| **Judge (s)** | Damith Thotawatte, Amal Ranarajah, Nawarathna Marasinghe | |
| **Attorney General's Dept.** | SDSG Haripriya Jayasundara, SC Lakmali Dissanayake and others | |
| **Police (CID / TID etc.)** | | |
| **Accused / Suspects** | Naufer Moulavi and 24 others | |
| **Lawyers for accused / suspects** | Noordeen M. Shaheed represent 6<br>Accused, 22,23 and 24 Accused were represented by Vijithananda Madawalagama | |
| **Aggrieved party** | | |
| **Lawyers for aggrieved party** | Nevil Abeyrathna PC, Riyanzi Arsakularathna PC, Suren D. Perera | |
| **Supporters of accused / suspects** | | |
| **Supporters of aggrieved party** | | |
| **Others** | | |

## 2. What happened in court hearing?

Attorney General's department made an application mentioning that they need further time to translate the summary of indictments to Tamil and English. Also, some Accused were unrepresented by lawyers. Therefore, Court granted 12th of January 2022 to complete those steps. Riyanzi Arsakularathna PC. Appeared for one of the victims and made an application regarding a MC record that he did not receive after filing a motion to the Court. Suren D. Perera AAL with Sashika Senarathna AAL appeared for 11 victims and marked their appearance. Though he made an application to submit the letters of appointments from the Victims to the Court, Judge Dammika Thotawaththa said that it is not needed due to the trust between the bench and the bar. Yet, can file in future if needed. So, the matter will be called on 12th of January 2022.

**3. Any significant observations inside court room and outside?**

Heavy security. There was a bomb detector gate just outside the Court. Media were present

**4. Next date & time:** 12/1/2022

**5. Media reports**

https://www.bbc.com/sinhala/sri-lanka-59302013?at_custom1=[post%20type]&at_medium=custom7&at_custom3=BBC%20Sinhala&at_custom4=4155BD1C-4D27-11EC-A6E9-90393A982C1E&at_custom2=facebook_page&at_campaign=64&fbclid=IwAR0xPf9tkpRObdaXQQWsqB91YxaMokUQdgFiyc_CPfYIfP-df_Dj5cFe-pE

https://www.reuters.com/world/asia-pacific/sri-lanka-begins-trial-25-accused-plotting-2019-easter-bombings-2021-11-23/

https://www.aljazeera.com/news/2021/11/23/sri-lanka-trials-2019-easter-sunday-bombings

# Trial Monitoring reports
# in case against former IGP
# Case no: - HC (TAB) 2900/21

## Trial Monitoring report

**About the case:** Easter Attack case against former IGP

**Case no. :** HC (TAB) 2900/21

**Courts:** Colombo High Court No. 3 Trial at Bar

**Date of hearing:** 22/11/21

**Author (s) of report:** Centre for Society and Religion (CSR)

### 1. Who was in courts:

| Who | Names / other information | Comments |
|---|---|---|
| **Judge (s)** | Namal Balalle,Adithya Patabandige, Mohomad Isardeen | |
| **Attorney General's Dept.** | SDSG Dileepa Peiris,SC Hansa Aberathna | |
| **Police (CID / TID etc.)** | | |
| **Accused / Suspects** | Pujitha Jayasundara | |
| **Lawyers for accused / suspects** | Roshan Dehiwala (Not clear) | |
| **Aggrieved party** | | |
| **Lawyers for aggrieved party** | | |
| **Supporters of accused / suspects** | | |
| **Supporters of aggrieved party** | | |
| **Others** | | |
| | | |

### 2. What happened in court hearing?

*Charges were read over to Mr. Pujitha Jayasundara and he pleaded not guilty. 33 admissions were recorded. Postmortem reports and JMO reports were admitted. He was charged with criminal negligence for failing to act despite receiving prior intelligence warnings in the 2019 Easter Sunday terror attack. (Around 855 charges and around 1200 witnesses)*

### 3. Any significant observations inside court room and outside?

*Very little crowd were present inside the Court house as well as outside.*

**4. Next date & time:** 23/11/21, The matter will be taken up in day to day basis

## 5. Media Reports

https://www.aljazeera.com/news/2021/11/23/sri-lanka-trials-2019-easter-sunday-bombings

http://www.dailynews.lk/2021/11/23/local/265383/easter-sunday-attacks-pujith-pleads-not-guilty-charges

**Trial Monitoring report**

**About the case:** Easter Attack case against former IGP

**Case no. :** HC (TAB) 2900/21

**Courts: Colombo** High Court No. 3 and 4 Trial at Bar

**Date of hearing:** 23/11/21

**Author (s) of report:** Centre for Society and Religion (CSR)

**1. Who was in courts:**

| Who | Names / other information | Comments |
|---|---|---|
| **Judge (s)** | Namal Balalle,Adithya Patabandige, Mohomad Isardeen | |
| **Attorney General's Dept.** | SDSG Dileepa Peiris,SDSG Sudarshana De Silva, SC Hansa Aberathna | |
| **Police (CID / TID etc.)** | | |
| **Accused / Suspects** | Pujitha Jayasundara | |
| **Lawyers for accused / suspects** | Roshan Dehiwala (Not clear) | |
| **Aggrieved party** | | |
| **Lawyers for aggrieved party** | | |
| **Supporters of accused / suspects** | | |
| **Supporters of aggrieved party** | | |
| **Others** | | |
| | | |

**2. What happened in court hearing?**

SDSG Dileepa Peiris led the evidence of chief of former State Intelligence Services Chief Nilantha Jayawardhana. According to him the SIS give information to IGP and Defense secretary to act upon and SIS cannot involve in any missions other than collecting information. He has given information about Saharan Hashim to IGP, Defense Secretary. He has sent 340 reports to them.

**3. Any significant observations inside court room and outside?**

**4. Next date & time:** 24/11/21, The matter will be taken up in day to day basis

**5. Media report**

https://www.youtube.com/watch?v=ruDYyKlETCQ

23:13 – 24:50 (Time duration)

https://www.youtube.com/watch?v=krMXahiVbvg

31:17 – 31:43 (Time duration)

https://www.youtube.com/watch?v=m_m1HoRbDkI

29:24 – 30:00 (Time duration)

## Trial Monitoring report

**About the case:** Easter Attack case against former IGP

**Case no:** HC (TAB) 2900/21

**Courts:** Colombo High Court No. 4 Trial at Bar

**Date of hearing:** 24/11/21

**Author (s) of report:** Centre for Society and Religion (CSR)

### 1. Who was in courts:

| **Who** | **Names / other information** | **Comments** |
|---|---|---|
| **Judge (s)** | Namal Balalle,Adithya Patabandige, Mohomad Isardeen | |
| **Attorney General's Dept.** | SDSG Dileepa Peiris, SC Hansa Aberathna | |
| **Police (CID / TID etc.)** | | |
| **Accused / Suspects** | Pujitha Jayasundara | |
| **Lawyers for accused / suspects** | Roshan Dehiwala, Dulan Mirihana, Priyanga Gunaratne, Nirmala Kodithuwakku and Jayantha Tilakaranna | |
| **Aggrieved party** | | |
| **Lawyers for aggrieved party** | | |
| **Supporters of accused / suspects** | | |
| **Supporters of aggrieved party** | | |
| **Others** | Media reporters / Students who have completed the final year examination of Law College, some of them work for law firms | |

### 2. What happened in court hearing?

- රාජ්‍ය බුද්ධිසේවාවේ හිටපු ප්‍රධානී විශ්‍රාමික නිලන්ත ජයවර්ධන මහතා අද දින පැමිණිල්ල වෙනුවෙන් සාක්ෂි ඉදිරිපත් කරන ලදී. ඒ අනුව විවිධ වාර්තා පැමිණිල්ලේ සාක්ෂි ලෙස 1 සිට 10 දක්වා ලකුණු කරන ලදී.
- එමෙන්ම සාක්ෂි විමසීම අතරතුරදී නඩුව විනාඩි 30කට කල් තැබීමක් සිදුව, නැවත සාක්ෂිකරුගෙන් දිවුරුම්පිට සාක්ෂි ලබා ගන්නා ලදී.

- එක්තරා වාර්තාවකට අදාලව, එහි පිටපත් බුද්ධි අංශ ලේඛනගත කිරීමේදී එහි ලිපි ශීර්ෂය (Letter head) සහිතව අදාල පිටපත් ගන්නේද යනුවෙන් විනිසුරු මඩුල්ල විසින් සාක්ෂිකරුගෙන් ප්‍රශ්නයක් විමසූ අතර, සාක්ෂිකරු ප්‍රකාශ කර සිටියේ අදාල ලේඛනය තමා විසින් අත්සන් කර අනතුරුව එහි ඡායාපිටපත් (Photocopy) ලබාගෙන ඒවා ලේඛනගත කර ඇති බවයි. එමෙන්ම එම කාර්යයන් සිදු කිරීමට විශේෂ වූ නිලධාරීන් සිටින බවද සාක්ෂිකරු පැවසුවේය.
- 2016.08.23 වන දින වාර්තාවක් පැමිණිල්ලේ සාක්ෂි අංක 2 ලෙස සටහන් කරන ලදී.
- 2016.11.10 වන දින රාජ්‍ය බුද්ධි සේවයේ වාර්තාවක් පැමිණිල්ලේ සාක්ෂි අංක 3 ලෙස සටහන් කරන ලදී. මෙම වාර්තාව ඇමුණුමකින් ද සමන්විත වූ අතර, මෙය පොලිස් මූලස්ථානයේ ඉල්ලීමක් පරිදි පොලිස්පතිට ලබා දුන් වාර්තාවකි.
- පැමිණිල්ලේ සාක්ෂි අංක 4 ලෙස සටහන් කරන ලද්දේ, ඇමුණුමක් ද සහිත වාර්තාවකි. මෙම වාර්තාව පොලිස්පතිගේ ඉල්ලීමක් පරිදි සකස් කරන ලද්දක් නොවන අතර, අනෙකුත් රාජ්‍ය අංශ දැනුවත් කිරීමට අදාළව සකස් කරන ලද වාර්තාවකි. මෙම වාර්තාවේ එක්තරා වීඩියෝ පටයක් ගැනද දක්වා ඇත.
- 2017.03.29 වන දින වාර්තාවක් පැමිණිල්ලේ සාක්ෂි අංක 5 ලෙස සටහන් කරන ලදී. මෙය 2017.03.13 වන දින "ලංකා ඊ නිව්ස්" හී පළ වූ ලිපියක් සම්බන්ධව කැඳවූ වාර්තාවකට අදාළව යවන ලද පිළිතුරු වාර්තාවකි. මෙහිදී 2017 වර්ෂයේ මාර්තු මාසයේදී එක්තරා ස්ථානයක, තවුහිද් ජමාත් සංවිධානය හා තවත් සංවිධානයක් අතර ඇතිවූ ගැටුමක් සම්බන්ධයෙන්ද දක්වන ලද අතර ප්‍රචාරණ කටයුතු සම්බන්ධයෙන් එම සංවිධාන දෙක අතර තරඟකාරී ස්වභාවයක් තිබූ බවද දක්වන ලදී. අත්අඩංගුවේ සිටින අයවලුන්ව ගෙනැවිත් ප්‍රශ්න කිරීමට බුද්ධි නිලධාරීන්ට නොහැකි බවද මෙහිදී ප්‍රකාශ විය.
- 2017.10.08 වන දින වාර්තාවක් පැමිණිල්ලේ සාක්ෂි අංක 6 ලෙස සටහන් කරන ලදී. සමාජ ජාලා භාවිත කරන ලද මුස්ලිම් තරුණයෙක් ගැන වාර්තාවේ සඳහන් වන බව දැක්වීය. තර්ජනයක් ඇති බවට දැනුවත් කිරීමට අවශ්‍ය වූ බව සාක්ෂිකරු ප්‍රකාශ කළ අතර, පොලීසියේ බිම් මට්ටම දැනුවත් කිරීමට අවශ්‍ය වූ බවද ප්‍රකාශ කරන ලදී.
- 2017.10.10 දින වාර්තාවක් පැමිණිල්ලේ සාක්ෂි අංක 7 ලෙස සටහන් කරන ලදී. සහරාන් හශීම්ගේ මුහුණු පොතේ (Facebook) ඡායාරූප කිහිපයක් පිළිබඳවද මෙහිදී ප්‍රකාශ කළ අතර, සහරාන් හශීම් එක් මුහුණුපොත් ගිණුමක් නොතිබූ බවටත්, ඔහු VPN භාවිත කර ඇති බවටත් සාක්ෂිකරු ප්‍රකාශ කරන ලදී.
- 2017.10.31 දින වාර්තාවක් පැමිණිල්ලේ සාක්ෂි අංක 8 ලෙස සටහන් කරන ලදී. මෙම වාර්තාව අතිශය රහසිගත වාර්තාවක් ලෙස සටහන් කර ඇත. අන්තවාදී පුද්ගලයන් 94 දෙනෙකුගේ නම්, ලිපින, ජාතික හැඳුනුම්පත් අංක ආදිය ඇතුළු තවත් තොරතුරු සටහන්ව තිබූ බවට දැක්වීය. මෙහි අංක 57 (සහරාන්) , අංක 58 (මොහොමඩ් ශයනි) අංක 64 (නවුෆර්) , අංක 52 (සහරාන්ගේ සහෝදරයා වූ රිල්වාන්) හි සඳහන් නම් පිළිබඳව විශේෂයෙන් සාකච්ඡා විය. තොරතුරු කරුවන් මාර්ගයෙන් මෙම තොරතුරු ලබාගෙන ඇත. මෙම නම් ලැයිස්තුව තුළ ස්වයං ඝාතකයන්ගේ ද නම් සඳහන් බව සාක්ෂිකරු විසින් පවසන ලදී. පොලීසියට මෙම වාර්තාව යවා ඇති අතර ඉන් පෙර ආරක්ෂක ලේකම්ටද මෙවන් වාර්තාවක් ඉදිරිපත් කර ඇති බවට ප්‍රකාශ විය.
- 2017.11.08 දිනැති, අබ්දුල් පිළිබඳ ලියවිල්ලක් වන රහසිගත ලියවිල්ලක්, පැමිණිල්ලේ සාක්ෂි අංක 9 ලෙස සටහන් කරන ලදී. අබ්දුල් යනු පැමිණිල්ලේ සාක්ෂි අංක 08 ලේඛනයේ, අංක 1 දරන අංකයෙන් සටහන් කර ඇති පුද්ගලයා වන අතර, ඔහු Taj Samudra හෝටලයේ බෝම්බය පුපුරාගැනීමට උත්සහ කළ නමුත්, එය අසාර්ථකව වෙනත් ස්ථානයකදී බෝම්බය පුපුරා ගත් තැනැත්තාය.
- පැමිණිල්ලේ සාක්ෂි අංක 10 ද සටහන් කරන ලදී.
- එක්තරා වාර්තා කිහිපයක් සාක්ෂි ලෙස ඉදිරිපත් කිරීමේදී එම වාර්තා ජනාධිපති කොමිෂන් සභාවේ සහතික කළ හෝ සත්‍ය පිටපත් [2]ලෙස දක්වා තිබූ අතර, එම වාර්තා වල මුල් පිටපත් පිළිබඳව ප්‍රශ්නාර්ථ ස්වභාවයක් හට ගන්නා ලදී.

[2] සහතික කළ පිටපතක් ද සත්‍ය පිටපතක් ද යන්න නිවැරදිව නොදනිමි. (Not clear)

- සාක්ෂිකරු කිහිප විටක් "මතකයේ විදිහට" යන වචනය සාක්ෂි ලබා දීමේදී භාවිත කල අතර, එම වචනය භාවිත නොකරන ලෙස විනිසුරුවරුන් උපදෙස් ලබා දෙන ලදී.

**3. Any significant observations inside court room and outside?**

යම් පමණකට පුද්ගලයන් රැස්ව සිටි නමුත් මාගේ නිරීක්ෂණය අනුව එය අසාමාන්‍ය තත්වයක් නොවේ.

**4. Next date & time:** 2021/11/25 – 9 am

**5. Media reports about the case on this date:**

- Sirasa 7pm news (24 November 2021) < https://www.youtube.com/watch?v=-dzhbshxXvE > (Time duration 23:35 – 27:24)
- Hiru TV NEWS 6:55PM **(**24 November 2021) **<https://youtu.be/KZUbP8Jrlow?t=1615** > (Time duration 26:55 – 29:28)

**Trial Monitoring report**

**About the case:** Easter Attack case against former IGP

**Case no:** HC (TAB) 2900/21

**Courts:** Colombo High Court No. 4 Trial at Bar

**Date of hearing:** 25/11/21

**Author (s) of report:** Centre for Society and Religion (CSR)

## 1. Who was in courts:

| Who | Names / other information | Comments |
|---|---|---|
| **Judge (s)** | Namal Balalle, Adithya Patabandige, Mohomad Isardeen | |
| **Attorney General's Dept.** | SDSG Dileepa Peiris, SC Hansa Aberathna | |
| **Police (CID / TID etc.)** | | |
| **Accused / Suspects** | Pujitha Jayasundara | |
| **Lawyers for accused / suspects** | Roshan Dehiwala, Dulan Mirihana, Priyanga Gunaratne, Nirmala Kodithuwakku and Jayantha Tilakaranna | |
| **Aggrieved party** | | |
| **Lawyers for aggrieved party** | | |
| **Supporters of accused / suspects** | | |
| **Supporters of aggrieved party** | | |
| **Others** | Media reporters / Students who have completed the final year examination of Law College, some of them work for law firms | |

## 2. What happened in court hearing?

- පැමිණිල්ල වෙනුවෙන් නිලන්ත ජයවර්ධන (හිටපු රාජ්‍ය බුද්ධි සේවා අධ්‍යක්ෂක / වර්තමාන ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති - මධ්‍යම පළාත) සාක්ෂි ලබා දෙන ලදී.
- පැමිණිල්ලේ සාක්ෂි අංක 11 ලෙස 2016.07.31 දිනැති වාර්තාව ලකුණු කරන ලදී. මෙහි ඇමුණුම් 5ක් ද ඇතුලත් බව දැක්වීය.
- මෙම සාක්ෂි වල මුල් ලේඛන පිළිබඳ ගැටළුවක් මතු විය. විත්තියේ නීතිඥවරයා ප්‍රකාශ කරන ලද්දේ, තම සේවාදායකයා ගත් ක්‍රියාමාර්ග ඇත්තේ මුල් ලේඛනයන්හී වන බැවින් හරස් ප්‍රශ්න ඇසීමේදී මුල් ලේඛන ගැනීමට සිදු වන බවයි. නැතිනම් තම සේවාදායකයා කිසිවක් සිදු නොකළ බවට අනුමිතියක්

ඇති වන බවට විත්තියේ නීතිඥවරයා තවදුරටත් ප්‍රකාශ කරන ලදී. මුල් ලේඛන ඉදිරිපත් කිරීමේ වගකීම ඇත්තේ පැමිණිලි පාර්ශවයට බව විනිසුරුවරයා ප්‍රකාශ කරන ලදී.

- විත්තියේ නීතිඥවරයා තවදුරටත් ප්‍රකාශ කරන ලද්දේ, නඩුව කඩිනමින් කිරීමට පහසු වීමට මුල් අවස්ථාවේ ලේඛන හා සාක්ෂි සම්බන්ධව පිළිගැනීමක් කළ බවත්, පසුව අධිචෝදනා පත්‍රයේ නොමැති ලේඛන ලකුණු කිරීමට පැමිණිල්ල උත්සහ ගත් බවත්ය. ඔහු වැඩිදුරටත් ප්‍රකාශ කරන ලද්දේ ජනාධිපති කොමිෂන් සභාවේ වාර්තා කරන ලද දෑ ඔවුන්ට අවශ්‍ය නොවන බවත්, පොලිස් දෙපාර්තමේන්තුවේ මුල් ලේඛන අවශ්‍ය බවත්ය. අධිචෝදනා පත්‍රයේ තිබෙන්නේ ලේඛන 6ක් හෝ 7ක් පමණක් බවත්, චෝදනාවේ ඇත්තේ 2019.04.09 සිට 21 දක්වා පමණක් බවත් ඔහු තවදුරටත් ප්‍රකාශ කරන ලදී.
- තිබෙනුයේ ජනාධිපති කොමිෂන් සභාව නිකුත් කළ සහතික පිටපත් හා ඡායා පිටපත් බවට පැමිණිල්ලේ නීතිඥවරයා ප්‍රකාශ කරන ලදී. සාක්ෂි ආඥාපනතේ 62 වගන්තියද සඳහන් කරන ලදී.
- 2017.03.20 වාර්තාවේ ඡායා පිටපතක් පැමිණිල්ලේ සාක්ෂි අංක 12 ලෙස ලකුණු කරන ලදී. අලියාර් ගැටුම සම්බන්ධව පොලිස් විමර්ශන පහසු කිරීමට යවන ලද වාර්තාවකි.
- 2017.03.14 වාර්තාවේ ඡායා පිටපත් පැමිණිල්ලේ සාක්ෂි අංක 13 ලෙස ලකුණු කරන ලදී. මෙයට සාක්ෂිකරු අත්සන් කර ඇත. ජාතික තවුහීජ් සංවිධානය පිළිබඳව පොලිස්පතිට කරන ලද වාර්තා කිරීමකි. ඉස්ලාම් රාජ්‍යය සම්බන්ධයෙන් පුළුල් ප්‍රචාරයක් කරන බවටත්, එයට ආගමට ලැදි තරුණ කොටස් සම්බන්ධ වන බවටත් මෙම වාර්තාවේ නිරීක්ෂණයක් කර ඇත.
- 2017.12.05 වාර්තාව සත්‍ය පිටපතක් ලෙස සහතික කර ඇති අතර, එය පැමිණිල්ලේ සාක්ෂි අංක 14 ලෙස ලකුණු කරන ලදී.
- 2017.12.30 වාර්තාව පැමිණිල්ලේ සාක්ෂි අංක 15 ලෙස ලකුණු කරන ලදී. NTJ නායකයා විසින් ව්‍යවස්ථාදායකය හා අධිකරණය විවේචනය කරමින් සමාජ ජාලා හරහා කළ ප්‍රචාරණයක් වාර්තා කිරීමක් මෙම වාර්තාවේ අන්තර්ගත වේ.
- 2018.01.14 දිනැති වාර්තාව පැමිණිල්ලේ සාක්ෂි අංක 16 ලෙස ලකුණු කරන ලදී. මෙය සාක්ෂිකරු අත්සන් කර ඇත. NTJ නායකයා ඉස්ලාම් රාජ්‍ය සම්බන්ධව සමාජ ජාලා හරහා කරන ලද ප්‍රචාරණය පිළිබඳව දැක්වීමක් මෙම වාර්තාවේ ඇති බවට ප්‍රකාශ විය.
- 2018.02.01 වන දිනැති වාර්තාව පැමිණිල්ලේ සාක්ෂි අංක 17 ලෙස ලකුණු කරන ලදී. මෙම වාර්තාව සමඟ ඇමුණුමක් ද විය. NTJ නායකයා මැතිවරණය හා තවුහීජ් ප්‍රතිපත්ති පිළිබඳ සමාජ ජාලා හරහා කරන ප්‍රචාරණයක් මෙහි අන්තර්ගත බවට දැක්විණි.
- සියලු ලේඛන ලකුණු කරන ලෙස විනිසුරුවන් දැක්වීම හේතුවෙන් අනෙකුත් ලේඛන එකවර ලකුණු කිරීමක් සිදු විය. ඒ අනුව 2018.02.20 දින වාර්තාව[3] පැමිණිල්ලේ සාක්ෂි අංක 18 ලෙසද, 2018.04.07 වන දින වාර්තාව පැමිණිල්ලේ සාක්ෂි අංක 19 ලෙසද, 2018.05.23 වන දිනැති වාර්තාව පැමිණිල්ලේ සාක්ෂි අංක 20 ලෙසද, 2018.05.27 දිනැති වාර්තාව හා ඇමුණුම පැමිණිල්ලේ සාක්ෂි අංක 21 ලෙසද, 2018.05.30 වාර්තාව පැමිණිල්ලේ සාක්ෂි අංක 22 ලෙසද, 2018.06.09 වාර්තාව පැමිණිල්ලේ සාක්ෂි අංක 23 ලෙසද, 2018.07.04 වාර්තාව පැමිණිල්ලේ සාක්ෂි අංක 24 ලෙසද, 2018.07.12 වාර්තාව පැමිණිල්ලේ සාක්ෂි අංක 25 ලෙසද, 2018.07.31 වාර්තාව පැමිණිල්ලේ සාක්ෂි අංක 26 ලෙසද, 2018.08.03 වාර්තාව පැමිණිල්ලේ සාක්ෂි අංක 27 ලෙසද, 2018.12.28 වාර්තාව පැමිණිල්ලේ සාක්ෂි අංක 28 ලෙසද, 2019.01.06 වාර්තාව පැමිණිල්ලේ සාක්ෂි අංක 29 ලෙසද, 2019.01.23 වාර්තාව පැමිණිල්ලේ සාක්ෂි අංක 30 ලෙසද, 2019.01.25 වාර්තාව පැමිණිල්ලේ සාක්ෂි අංක 31 ලෙසද, 2019.01.31 වාර්තාව පැමිණිල්ලේ සාක්ෂි අංක 32 ලෙසද, 2019.02.02 වාර්තාව පැමිණිල්ලේ සාක්ෂි අංක 33 ලෙසද, 2019.02.15 වාර්තාව පැමිණිල්ලේ සාක්ෂි අංක 34 ලෙසද ලකුණු කරන ලදී.
- පැමිණිල්ලේ සාක්ෂි අංක 20 හා සබැඳිව අධිකරණය මඟ හැර පළාගිය සහරාන්ව ඉක්මනින් අත්අඩංගුවට ගැනීම අවශ්‍ය වේ යනුවෙන් කරන ලද දැක්වීමක් විය.
- පැමිණිල්ලේ සාක්ෂි සාකච්ඡා කිරීමේදී නැවත වරක් වැරදි ඇමුණුම් වාර්තාවට එකතු කිරීමක් දක්නට ලැබිනි. ඒ අනුව original (මුල් ලේඛනය) නොදැක ලකුණු කිරීම වැරැද්දක් බව විනිසුරුවරයා කියා සිටින ලදී.

[3] තවත් අවස්ථාවකදී පැමිණිල්ලේ සාක්ෂි අංක 18, 2018.01.28 වාර්තාව ලෙස සඳහන් කරන ලදී.

- පැමිණිල්ලේ සාක්ෂි අංක 30 සාකච්ඡා කරමින්, එය සබරගමුව, මධ්‍යම පළාත් වල බෞද්ධ, හින්දු, කතෝලික ප්‍රතිමා වලට හානි කිරීම සම්බන්ධ වාර්තාවක් බව දැක්වීය. එහි එම ප්‍රහාර එල්ල කළ පුද්ගලයන් සම්බන්ධවද දක්වා ඇති බව ප්‍රකාශ විය.
- පැමිණිල්ලේ සාක්ෂි අංක 31 හී සබරගමුව, මධ්‍යම පළාත් වල බෞද්ධ, හින්දු, කතෝලික ප්‍රතිමා වලට හානි කිරීමට අදාළ ප්‍රධාන සැකකරුවන් දෙදෙනෙකු සමඟ සම්බන්ධතා පැවැත් වූ පුද්ගලයන් 13 දෙනෙකු සම්බන්ධ තොරතුරු පිළිබඳ දක්වා ඇති බවට ප්‍රකාශ විය.
- පැමිණිල්ලේ සාක්ෂි අංක 32, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය පොලිස්පති සෙනෙවිරත්නට යොමු කරන ලද්දක් බවත් එය සමඟ ඇමුණුමක් ද වන බවත් ප්‍රකාශ විය. ලංකාව පුරා ISIS වලට සම්බන්ධ 129ක් පුද්ගලයන් පිළිබඳ අතිරහස්‍ය වාර්තාවක් බවට ප්‍රකාශ කරන ලදී.
- පැමිණිල්ලේ සාක්ෂි අංක 34 පොලිස්පති වෙත යොමු කරන ලද්දකි. ඉස්ලාමීය මූලධර්මවාදය සම්බන්ධව පිළියෙල කරන ලද වාර්තාවකි.
- රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂක, සහරාන් හා අන්තවාදය සම්බන්ධව වාර්තාවන් 340ක් පමණ සම්පාදනය කර ඇති බවටත්, එයින් යම් ප්‍රමාණයක් පොලිස්පතිට ඉදිරිපත් කර ඇති බවටත් ප්‍රකාශ විය.
- 2018 දෙසැම්බර් 23, 26 මාවනැල්ල බුදු පිළිම සඳහා හානි කිරීමෙන් පසුව පුද්ගලයන් 129 දෙනාගේ වාර්තාව යවා ඇති බවට දැක්වීය. ඉන්පෙර මන්නාරමෙහි බුදු පිළිම වලටද හානි කර ඇති බවට ප්‍රකාශ විය.
- 2019 වර්ෂයේ ජනවාරි මාසයේ වනාතවිල්ලුව ප්‍රදේශයෙන් අවි ආයුධ ලැබීමක් සම්බන්ධයෙන් ද ප්‍රකාශ විය.
- ප්‍රහාරය සම්බන්ධ මුල් තොරතුර 2019 අප්‍රේල් මස 04 වන දින සාක්ෂිකරුට විදේශීය තොරතුරුකරුවකුගෙන් WhatsApp මාර්ගයෙන් ලැබී ඇති බවට ප්‍රකාශ විය. සාක්ෂිකරු තොරතුරුකරු වෙත දුරකථන ඇමතුමක් ලබා දී ඇති බවටත් ප්‍රකාශ විය. එම ලැබුණු තොරතුර නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයාට හා සහකාර අධ්‍යක්ෂවරුන්ට සාක්ෂිකරු දැනුවත් කර තොරතුර develop (වැඩි දියුණු කරනවා) කිරීමට දන්වා ඇති බවටද ප්‍රකාශ විය. අදාළ තොරතුර ලිඛිතව අවශ්‍ය බව තොරතුරුකරු වෙත දන්වා ඇති අතර එම තොරතුර 5 වන දින ලිඛිතව ලබා දී ඇති බවටද ප්‍රකාශ විය.
- දෙවන මූලාශ්‍රයක් ගැනද සඳහන් විය. මෙයද විදේශීය මූලාශ්‍රයකි.
- අප්‍රේල් මස 04 වන දින ලද තොරතුරට අදාළ screenshot පැමිණිල්ලේ සාක්ෂි අංක 35 ලෙස ලකුණු කරන ලදී.
- ජාතික බුද්ධි ප්‍රධානීට යවන ලද ලිපියක් පැමිණිල්ලේ සාක්ෂි අංක 36 ලෙස ලකුණු කරන ලදී. මෙයට ඇමුණුමක් ද සහිත බව ප්‍රකාශ විය.
- තමන්ට තොරතුරක් ලැබුණු බවට සාක්ෂිකරු 7 වනදා උදෑසන පොලිස්පතිට ජංගම දුරකථනයෙන් දුරකථන ඇමතුමක් ලබාදී ප්‍රකාශ කළ බවට සඳහන් කරන ලදී.
- 9 වෙනිදා පොලිස්පතිට යවන ලද වාර්තාවක් පැමිණිල්ලේ සාක්ෂි අංක 37 ලෙස ලකුණු කරන ලදී.

**3. Any significant observations inside court room and outside? -** පෙර දිනයේදී මෙන් උසාවිය තුළ විශාල නීතිඥයන් සංඛ්‍යාවක් රැස්ව සිටියේ නැත.

**4. Next date & time:** 2021/11/26 – 1 pm

**5. Media reports about the case on this date:**

- Sirasa, <News 1st: Prime Time Sinhala News - 7 PM | (25/11/2021) රාත්‍රී 7.00 ප්‍රධාන පුවෘත්ති - YouTube> accessed 29 November 2021 (Time duration: 24:45 – 27.22)

## Trial Monitoring report

**About the case:** Easter Sunday Attacks case against former IGP

**Case no. :** HC (TAB) 2900/21

**Courts:** Colombo High Court No. 4 Trial-at-Bar

**Date of hearing:** 26/11/21

**Author (s) of report:** Centre for Society and Religion (CSR)

## 1. Who was in courts:

| Who | Names / other information | Comments |
|---|---|---|
| Judge (s) | Namal Balalle,Adithya Patabandige, Mohomad Isardeen | |
| Attorney General's Dept. | SDSG Dileepa Peiris,SDSG Sudarshana De Silva, SC Hansa Aberathna | |
| Police (CID / TID etc.) | | |
| Accused / Suspects | Pujitha Jayasundara | |
| Lawyers for accused / suspects | Ranjith dehiwala | |
| Aggrieved party | | |
| Lawyers for aggrieved party | Not appeared | |
| Supporters of accused / suspects | | |
| Supporters of aggrieved party | | |
| Others | | |
| | | |

## 2. What happened in court hearing?

SDSG Dileepa Peiris led the evidence in chief of the former Chief of State Intelligence Service, Nilantha Jayawardhana who is the 1$^{st}$ witness of the case. The witness testified that he have received preliminary information on attacks to eight places including catholic churches from a secret agent on the 4$^{th}$ April 2019. A discussion regarding possible attacks was held in the National Security Council on the 9$^{th}$ April 2019. The witness said that a motorcycle blast was taken place in Kaththankudi area on 16$^{th}$ April 2019 in line with the major attacks. Again, on the 20$^{th}$ April 2019 (in the evening), the witness had received information that is of credible intelligence nature which proved a greater possibility of Easter Attacks being taken place on the 21$^{st}$ April 2021 during the time span of 7.00 A.M to 10.00 A.M. The witness testified that the information received was forwarded to eight officials including the then IGP and then secretary to the Defense on time.

**3. Any significant observations inside court room and outside?** The police officials at the entrance of the court no.4 barred lay people being entered the courthouse. Summons served for the present IGP to appear before the court on 29 November 2021.

**4. Next date & time:** 29/11/21

**5. Relevant link**

http://www.colombopage.com/archive_21B/Nov26_1637942857CH.php (Colombo Page, 26 November 2021)

# Trial Monitoring reports
# in case against former Defence Secretary
# Case no: - HC (TAB) 2899/21

**About the case:** Easter Attack case against former Defence Secretary

**Case no:** HC (TAB) 2899/21

**Courts:** Colombo High Court No. 4 Trial at Bar

**Date of hearing:** 25/11/2021

**Author (s) of report:** Centre for Society and Religion (CSR)

## 1. Who was in courts:

| Who | Names / other information | Comments |
|---|---|---|
| **Judge (s)** | Namal Balalle,Adithya Patabandige, Mohomad Isardeen | |
| **Attorney General's Dept.** | Additional solicitor general Sudarshana De Silva | |
| **Police (CID / TID etc.)** | | |
| **Accused / Suspects** | Hemasiri Fernando | |
| **Lawyers for accused / suspects** | Mohan Weerakoon, PC | |
| **Aggrieved party** | | |
| **Lawyers for aggrieved party** | | |
| **Supporters of accused / suspects** | | |
| **Supporters of aggrieved party** | | |
| **Others** | Media reporters | |

## 2. What happened in court hearing?

- පැමිණිල්ල වෙනුවෙන් නිලන්ත ජයවර්ධන (හිටපු රාජ්‍ය බුද්ධි සේවා අධ්‍යක්ෂක / වර්තමාන ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති - මධ්‍යම පළාත) සාක්ෂි ලබා දෙන ලදී.
- සාක්ෂි ලබාදෙමින් ඉහත සාක්ෂිකරු 2019.04.20 දින පොලිස්පතිට යවන ලද ලිපියක් පිළිබඳ සඳහන් කරන ලදී. සහරාන් හා ඔහුගේ සමීපතමයන් පිළිබඳ එහි දක්වා ඇත. එම ලිපියේ දක්වා ඇති පුද්ගලයන්ගෙන් පස් දෙනෙකුන් පමණ ප්‍රශ්නගත ප්‍රහාරයේදී ජීවිතක්ෂයට පත්ව ඇත. අදාළ ලිපිය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය පොලිස්පති වෙතද යවා ඇති බවට ප්‍රකාශ විය.
- 16 වන දින (කිනම් වර්ෂයේ කිනම් මාසයේද යන්න සඳහනක් නොමැත.) බෝම්බ පිපිරීම සම්බන්ධ විමර්ශනය පිළිබඳ පොලිස්පතිට දැනුම් දීමක් කර ඇත. එමෙන්ම 16 වන දින පිපිරීම පිළිබඳව හිටපු ආරක්ෂක ලේකම් වෙත WhatsApp මාර්ගයෙන් පින්තූර යවා ඉහත සාක්ෂිකරු විසින් දූරකථනයෙන් ද දන්වා ඇත. කෙසේ නමුත් හිටපු පොලිස්පති හෝ ආරක්ෂක ලේකම් වරයා ඔහුගෙන් නැවත විමසීම් කර නැත.
- 2019.04.20 වන දින සවස 4.15ට පමණ ඉහත නම් සඳහන් සාක්ෂිකරුට WhatsApp message යක් පැමිණ ඇත. එහි " According to reliable input Zahran Hashim on or before 21st **….**" ස්ථාන 8ක් ඉලක්ක කරනවා... **"**Including the hotel and church" ආදී සඳහනක් ගැන දක්වයි. මෙම තොරතුර වැදගත් බුද්ධි තොරතුරක් ලෙස ගත යුතු බවට ඉහත සාක්ෂිකරු විශ්වාස කර ඇත. මෙම තොරතුර

සාක්ෂිකරු විසින් හිටපු ආරක්ෂක ලේකම්ට යවන ලද screenshot පැමිණිල්ලෙ සාක්ෂි අංක 15 ලෙස ලකුණු කරන ලදී. මෙලෙස මෙම තොරතුර 16:53 ට යවා ඇති අතර 18:23 ට well received යනුවෙන් එයට ප්‍රතිචාරයක් ලැබී ඇත. 20 වනදා මෙම තොරතුර යවනුයේ 21 වනදා සිදුවන දෙයක් සම්බන්ධයෙනි. ඉහත සාක්ෂිකරු තොරතුර යවා පස්වරු 6යි ගණනකට හිටපු ආරක්ෂක ලේකම් වෙත දුරකථන ඇමතුමක් ලබා දී ඇත. ආරක්ෂක ලේකම්ට කතා කිරීමට පෙර සාක්ෂිකරු පොලිස්පතිට කතා කළ විට ඔහු මෙය එතරම් බරපතල (serious) ලෙස නොගත් බවට තේරුණ බවද සාක්ෂිකරු විසින් ආරක්ෂක ලේකම්ට පවසා ඇත.

- ලැබී තිබූ අනෙකුත් තොරතුරු සමඟ ගත් කල්හී මෙවන් ප්‍රහාරයක් සිදු විය හැකි බවට සාක්ෂිකරුට සිතී ඇති බව දැක්විය.
- ක්‍රිස්තියානි ආගමෙහි මෙවන් දිනයක් එළඹෙන බව දැන සිටියත් එදින ප්‍රහාරයක් එල්ල විය හැකි බවට සාක්ෂිකරුගේ මතකයට පැමිණ නැති බව හැඟවෙන ප්‍රකාශයක් සාක්ෂි ලබා දෙමින් සාක්ෂිකරු පැවසුවේය.
- පොලිස් ආඥා පනතේ 56 වගන්තිය යටතේ කළ හැකි දේවල් තිබුණේද යනුවෙන් නීතිඥවරයා අසන ලද ප්‍රශ්නයට පිළිතුරු දෙමින් සාක්ෂිකරු පවසන ලද්දේ, අදාළ ස්ථානයට ආරක්ෂාව ලබා දීමට හැකියාව තිබුණා යනුවෙනි.
- අප්‍රේල් මස 21 වන දින ලැබුණ තොරතුරක් පැමිණිල්ලේ සාක්ෂි අංක 16 ලෙස ලකුණු කරයි. 8.46ට අදාළ තොරතුර ආරක්ෂක ලේකම්ට යොමු කර ඇත.
- දුරකථන තොරතුරු ඇතුලත් ලේඛනයක් සාක්ෂිකරුට පෙන්වූ අතර. එය පැමිණිල්ලේ සාක්ෂි අංක 17 ලෙස ලකුණු කරන ලදී.
- මූලික ප්‍රශ්න විමසීම (පැමිණිලි පක්ෂය වෙනුවෙන් පෙනී සිටින නීතිඥවරයා සාක්ෂිකරුගෙන් ප්‍රශ්න විමසීම) අවසන් කර හරස් ප්‍රශ්න විමසීම (එනම් සාක්ෂිකරුගෙන් විත්තියේ නීතිඥවරයා ප්‍රශ්න ඇසීම) ආරම්භ කරන ලදී.
- පැමිණිල්ලේ සාක්ෂි අංක 1 සිට 7 දක්වා, ආරක්ෂක ලේකම්ට යවන ලද වාර්තා අන්තර්ගත බවට සඳහන් කරන ලදී.
- ජාතික බුද්ධි ප්‍රධානී සිසිර මෙන්ඩිස් වෙත ලිඛිතව යවන ලද්දක්, පැමිණිල්ලේ සාක්ෂි අංක 9 ලෙස දක්වා ඇත. එහි Top Secret ලෙස දක්වා තිබූ බව ප්‍රකාශ විය.
- පැමිණිල්ලේ සාක්ෂි අංක 10, 2019 අප්‍රේල් 09 වන දින අතිරහස්‍ය ලෙස පොලිස්පතිට යවන ලද ලිපියකි.
- පැමිණිල්ලේ සාක්ෂි අංක 11 පොලිස්පති තුමා, පොලිස් මූලස්ථානය යන්නට යවා ඇති ලිපියකි.
- සාහි නැමැත්තාව අත්අඩංගුවට ගතහොත් සහරාන්ව සොයාගත හැකි බව දක්වා ඇති ලේඛනයක් පිළිබඳවද ප්‍රකාශ විය.
- විත්තියේ නීතිඥයා මහතා වාර්තාවන්හී අවසාන වාක්‍යයන් දැක්වීම් කරන ලදී. කෙසේ නමුත් සාක්ෂිකරු ප්‍රකාශ කරන ලද්දේ අවසාන වාක්‍යය පමණක් කියවා තේරුම් ගැනීමට නොහැකි බවත්, වාර්තාවේ අන්තර්ගතයේ බොහෝ තොරතුරු ඇති බවත්ය. (සාක්ෂිකරුගේ ඉහත ප්‍රකාශයට පෙර අවස්ථාවකදී විත්තියේ නීතිඥවරයා කරන ලද දැක්වීම් සඳහා උදාහරණ:- පැ.02 – "නිරීක්ෂණය වේය", පැ.03 – "නිරීක්ෂණය වේය", පැ. 04 – "පෙනී යයි", පැ.05 – "නිරීක්ෂණය වේය", පැ.06 – "සිදු කෙරෙමින් පවතී", පැ.07 – "නිරීක්ෂණය වේය.")

### 3. Any significant observations inside court room and outside? -

- හිටපු පොලිස්පතිගේ නඩුවට මෙන් එතරම් පිරිසක් මෙම නඩුව සඳහා මහාධිකරණයේ රැස්ව සිටියේ නැත.

### 4. Next date & time: 2021/11/26 – 1 pm

## 5. Media reports about the case on this date:

- තිළිණි ද සිල්වා, 'පාස්කු ප්‍රහාරය වළක්වා ගැනීමට පියවර නොගැනීමේ වගකීම මට බාර ගන්න බෑ' (*ලංකාදීප online*, 25 November 2021)<පාස්කු ප්‍රහාරය වළක්වා ගැනීමට පියවර නොගැනීමේ වගකීම මට බාර ගන්න බෑ - Lankadeepa Online> accessed 27 November 2021
- Sirasa, <News 1st: Prime Time Sinhala News - 7 PM | (25/11/2021) රාත්‍රී 7.00 ප්‍රධාන ප්‍රවෘත්ති - YouTube> accessed 29 November 2021 (Time duration: 24:45 – 27.22)

**About the case:** Easter Sunday Attacks case against former Secretary to Defense

**Case no. :** HC (TAB) 2899/21

**Courts:** Colombo High Court No. 4 Trial-at-Bar

**Date of hearing:** 26/11/21

**Author (s) of report:** Centre for Society and Religion (CSR)

**1. Who was in courts:**

| Who | Names / other information | Comments |
|---|---|---|
| Judge (s) | Namal Balalle,Adithya Patabandige, Mohomad Isardeen | |
| Attorney General's Dept. | SDSG Sudarshana De Silva | |
| Police (CID / TID etc.) | | |
| Accused / Suspects | Hemasiri Fernando | |
| Lawyers for accused / suspects | Mohan Weerakoon, PC | |
| Aggrieved party | | |
| Lawyers for aggrieved party | Not appeared | |
| Supporters of accused / suspects | | |
| Supporters of aggrieved party | | |
| Others | | |
| | | |

**2. What happened in court hearing?**

The defense cross examined the 1st witness, the former Chief of State Intelligence Service, Nilantha Jayawardhana where the defense marked discrepancies of the evidence given by the witness on 23rd November 2021. The judges advised the defense not to ask unnecessary political questions like Constitutional coup in October 2018; power imbalance that was seen in the governance during 2018; Parliamentary proceedings.

**3. Any significant observations inside court room and outside?** The police officials at the entrance of the court no.4 barred lay people being entered the courthouse.

**4. Next date & time:** 13/12/21 9.30 A.M

## 5. Relevant link

https://ceylontoday.lk/news/easter-sunday-attacks-trial-fmr-sis-chief-says-had-no-inkling-of-attack-until-20-april *(Ceylon Today, 27 Nov 2021)*

**About the case:** Easter Sunday Attacks case against former Deference Secretary

**Case no. :** HC (TAB) 2899/21

**Courts:** Colombo High Court No. 4 Trial-at-Bar

**Date of hearing:** 13/12/21

**Author (s) of report:** Centre for Society and Religion (CSR)

**1. Who was in courts:**

| Who | Names / other information | Comments |
|---|---|---|
| Judge (s) | Namal Balalle,Adithya Patabandige, Mohomad Isardeen | |
| Attorney General's Dept. | SDSG Sudarshana De Silva | |
| Police (CID / TID etc.) | | |
| Accused / Suspects | Hemasiri Fernando | |
| Lawyers for accused / suspects | Mohan Weerakoon, PC | |
| Aggrieved party | | |
| Lawyers for aggrieved party | Not appeared | |
| Supporters of accused / suspects | | |
| Supporters of aggrieved party | | |
| Others | | |
| | | |

**2. What happened in court hearing?**

SDSG Sudharshana De Silva led the evidence in chief of the former director of intelligence, Sri Lanka Army, H.K.Kodithuwakku. The witness explained how the Sri Lanka army receive intelligence information, how a piece of ordinary information transform into intelligence information, and what steps to be followed in this process. As revealed, the witness has informed the IGP to take due legal action against Zaharan Hashim in nine instances during the time span of 2017- April 2019. The honorable judges asked the witness that whether the 1$^{st}$ Witness, Nilantha Jayawardhana had presented the information received by the state Intelligence service on 4th April 2019 to the National Intelligence Council (NIC) that was held on 9$^{th}$ April 2019. The witness said no information presented by the 1$^{st}$ witness in the NIC on the said date.

**3. Any significant observations inside court room and outside?** The prosecution informed that the prosecution will not call the witnesses numbered 922, 932, 1030 and 1216 for this case. The

prosecution informed the court that the prosecution intends to produce video evidence in the next hearings.

**4. Next date & time:** 14/12/21 9.30 A.M

**5. Relevant link**

https://www.hirunews.lk/english/290917/special-revelation-made-in-court-regarding-easter-attacks-video *(Hiru News, 13 December 2021)*

**Trial Monitoring report**

**About the case:** Easter Attack case against former Defence Secretary

**Case no:** HC (TAB) 2899/21

**Courts:** Colombo High Court No. 4 Trial at Bar

**Date of hearing:** 14/12/2021

**Author (s) of report:** Centre for Society and Religion (CSR)

## 1. Who was in courts:

| Who | Names / other information | Comments |
|---|---|---|
| **Judge (s)** | Namal Balalle, Adithya Patabandige, Mohomad Isardeen | |
| **Attorney General's Dept.** | Additional solicitor general Sudarshana De Silva | |
| **Police (CID / TID etc.)** | | |
| **Accused / Suspects** | Hemasiri Fernando | |
| **Lawyers for accused / suspects** | Mohan Weerakoon, PC | |
| **Aggrieved party** | | |
| **Lawyers for aggrieved party** | | |
| **Supporters of accused / suspects** | | |
| **Supporters of aggrieved party** | | |
| **Others** | Journalists, Catholic Priests and others whose identity was not visible | |

## 2. What happened in court hearing?

- විත්තිකාර හිටපු ආරක්ෂක ලේකම් විසින් මාධ්‍යට කළ ප්‍රකාශයක් අන්තර්ගත වීඩියෝ පටයක් අධිකරණය තුළ වාදනය කළ අතර එම හඬපටය හා සබැඳිව ඉංග්‍රීසි බසින් සැකසුන ලේඛනයක් අධිකරණයට පැමිණිලි පාර්ශවය විසින් ලබා දෙන ලදී. එම වීඩියෝව දෙරණ පුවත් විකාශයක කොටසක් වූ අතර, 22/04/2019 දින ප්‍රවෘත්තියක් බව එම වීඩියෝවේ දිස්වන්නට විය. එම වීඩියෝව අන්තර්ගත CD හා අධිකරණයට ලබා දුන් ඉහත සඳහන් කරන ලද ලේඛනය පැමිණිල්ලේ සාක්ෂි අංක 22 හා 23 ලෙස ලකුණු කරන ලදී. (පැ 22, පැ 23 )
- පැමිණිල්ලේ සාක්ෂිකරුවකු ලෙසින් දෙරණ මාධ්‍ය ජාලයේ ජ්‍යෙෂ්ඨ ප්‍රවෘත්ති කළමනාකරු, තරංග නිමේෂ් ජයකොඩි සාක්ෂි ලබා දෙන ලදී. ඉහත සඳහන් කරන ලද වීඩියෝව පිළිබඳව ද මොහු සාක්ෂි ලබා දෙන ලදී. හරස් ප්‍රශ්න ඇසීමක් ද සිදු විය. විනිසුරුවරයකු විසින් මෙය දෙරණ මාධ්‍යයෙන් ගත් ප්‍රකාශයක් ද යන්න විමසූ කල්හී සාක්ෂිකරු පැහැදිලි කිරීම් සමඟින් ප්‍රකාශ කර සිටියේ විදේශ මාධ්‍යවේදියකු විසින් එහිදී හිටපු ආරක්ෂක ලේකම් වරයාගෙන් ප්‍රශ්න ඇසීමේදී දෙරණ කැමරා ශිල්පියකු විසින් එය වීඩියෝ කළ බවත් එහිදී දෙරණෙහි මයික් භාවිත කළ බවත්ය.
- සමීර රොද්‍රිගු පියතුමන් ද සාක්ෂි ලබා දෙන ලදී. එතුමන් පාස්කු ප්‍රහාරය වන විට රෝමානු කතෝලික දේවස්ථානයක් වන කටුවාපිටිය ශාන්ත සෙබස්තියන් දේවස්ථානයේ සිට ඇති අතර, දිව්‍ය පූජාව අවසන් වී ධර්ම සේවාවේ සාමාජිකයකු ස්තූති කතාව කරන විට ප්‍රහාරය සිදු වී ඇත. එහිදී ශබ්දයක් සමඟ දේවස්ථානය දුමෙන් වැසී යාමක් සිදු වූ බවට ප්‍රකාශ විය. මෙම ප්‍රහාරය වන විට දේවස්ථානය තුළ 800ත් 1000ත් අතර පිරිසක් සිටි බවටත් පිටතත් පිරිසක් සිටි බවටත් සාක්ෂිකරු ප්‍රකාශ කරන ලදී.

ප්‍රහාරය පිළිබඳව පෙර දැනුම් දීමක් ලැබී නොතිබුණු බවද සාක්ෂිකරු සාක්ෂි දෙමින් ප්‍රකාශ කරන ලදී. මෙහි දී එම දේවස්ථානයේ ජනවාරි 30 දින උත්සවාකාරයෙන් උත්සවයක් පවත්වන බවත් එයට පොලිස් ආරක්ෂාවක් ඉල්ලා සිටින බවත්, සාමාන්‍ය උත්සව වලදී පොලිස් සංචාර සිදුවන බවත් සාක්ෂිකරුගේ සාක්ෂි ලබා දීම් වලදී අනාවරණය විය.

- සාක්ෂිකාර උපාලි රත්නායක මහතා සාක්ෂි ලබා දෙන ලදී. ඔහු 2019 වර්ෂයේදී අධ්‍යක්ෂ ජෙනරාල් - සංචාරක සංවර්ධන අධිකාරිය යන තනතුර දරා ඇති අතර වර්තමානයේ වෙනත් තනතුරක් දරයි. සංචාරක හෝටල් වල ආරක්ෂාවට ගන්නා ක්‍රියාමාර්ග දෙකක් පිළිබඳව මෙහිදී දක්වන ලදී. එනම්, ඒ ඒ හෝටල් වලින් පවත්වාගන්නා ආරක්ෂාව හා සංචාරක පොලීසිය ලබාදෙන සංචාරකයන්ට අවශ්‍ය සිවිල් ආරක්ෂාවයි. විනිසුරුවරයකුගේ ප්‍රශ්න සඳහා පිළිතුරු දෙමින් සාක්ෂිකරු අනාවරණය කරන ලද්දේ, බඩු මලු පරික්ෂා කිරීමටත්, ලැගුම් ගැනීමට පැමිණෙන අයවලුන් පරික්ෂා කිරීමටත් බාධාවක් නොතිබූ බවයි.
- හිටපු ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය - රුවන් විජේවර්ධන මහතාද සාක්ෂි ලබා දෙන ලදී. ගැසට් කරන ලද ආයතන 4ක් සාක්ෂිකරු යටතට පවරා තිබී ඇති අතර පසුව තව ආයතන සම්බන්ධවද වගකීම සාක්ෂිකරුට ලබා දී ඇත. ජනාධිපති විදෙස්ගත වන විට ඇතැම් අවස්ථා වලදී සාක්ෂිකරුව වැඩබලන ආරක්ෂක අමාත්‍ය ධූරයට පත් කර ඇති අතර, ඇතැම් අවස්ථා වලදී සාක්ෂිකරුට පත්වීම් ලිපිය ලැබෙන විට ජනාධිපතිතුමන් විදෙස්ගතව ලංකාවට පැමිණීම ද සිදුවී අවසන් බව අනාවරණය විය. ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාගේ පාලන සමයේ ආරක්ෂක ලේක්මවරුන් පස් දෙනෙකු කලින් කලට පත්වී ඇති බවත් ප්‍රකාශ විය. බුද්ධි සමාලෝචන රැස්වීම් වල සාරාංශයක් ලේඛනගත කළ බවත්, ඊළඟ රැස්වීමට යන කල්හී ඒ ලේඛනගත කිරීම් සාක්ෂිකරුට ලැබී ඇති බවටත් අනාවරණය විය. කෙසේ නමුත් 2018 වර්ෂයේ වූ දින 52 හි අගමැති මාරු වීමේ ගැටලුවෙන් පසුව කිසිම ආරක්ෂක අංශයකින් සාක්ෂිකරුට බුද්ධි වාර්තාවක් ලැබී නැත. මෙහිදී දැක්වූ තවත් කරුණක් වන්නේ, ජනාධිපති ලේකම් කාර්යාලයෙන් ආරක්ෂක මණ්ඩල රැස්වීම් වලට කැඳවන බව හා ආරක්ෂක ලේකම් කාර්යාලයෙන් බුද්ධි සමාලෝචන රැස්වීම් වලට කැඳවන බවයි. සාක්ෂිකරු පාස්කු ප්‍රහාරය පිළිබඳව මුලින්ම දැනගෙන තිබෙන්නේ හිටපු අගමැතිවරයා ලබාදුන් දුරකථන ඇමතුමකින්ය. සාක්ෂිකරු තොරතුර ලැබුණ කල්හී ආරක්ෂක අමාත්‍යාංශයට ගිය බව ප්‍රකාශ කරන ලදී. ඒ අවස්ථාවේදී ආරක්ෂක මණ්ඩල රැස්වීමක් පැවැත්වීමට අගමැතිවරයා උත්සහ කළ නමුත් එය අසාර්ථක වූ බවත් අනාවරණය විය. රනිල් වික්‍රමසිංහ මහතා සාක්ෂිකරුට දුරකථන ඇමතුමක් ලබා දී අරලියගහ මන්දිරයේ ආරක්ෂක මණ්ඩල රැස්වීමක් කැඳවන ලෙස දැනුම් දුන් බවටත්, එම අවස්ථාවේ ආරක්ෂක අමාත්‍යාංශයට ප්‍රධාන නිලධාරීන් රැස්ව සිටි නමුත්, එහිදී එම නිලධාරීන්ට ආරක්ෂක මණ්ඩල රැස්වීමක් සඳහා අගමැතිවරයා අරලිය ගහ මන්දිරයට කැඳවූ බවට දැනුම් දුන්නද කිසිවකු නැගිට්ටේ නැති බවටත් අනාවරණය විය. එම රැස්වීම කැඳවීමට උත්සහ ගැනීමේදී, අගමැති කැඳවන කිසිම රැස්වීමකට නොයන ලෙස, හිටපු ආරක්ෂක ලේකම්වරයාට ජනාධිපති උපදෙස් ලබා දී ඇත, යනුවෙන් විත්තිකරු ප්‍රකාශයක් කළ බවටද අනාවරණය විය. එදින සාක්ෂිකරු, රාජ්‍ය බුද්ධි සේවයේ හිටපු ප්‍රධානී නිලන්ත ජයවර්ධන මහතාගෙන් විමසීමක් කළ කල්හී, ආරක්ෂක ලේකම්තුමාට හා අනෙක් නිලධාරීන්ට තොරතුරු සැපයූ බව දක්වා ඇති අතර සාක්ෂිකරුට එම තොරතුරු නොදීම සම්බන්ධයෙන් සමාව ඉල්ලා ඇති බව සාක්ෂිකරු දැක්වීය. විත්තිකරුගේ කැමැත්තෙන් ආරක්ෂක මණ්ඩල රැස්වීම් පැවැත්විය නොහැකි බවටත් එය කැඳවිය හැක්කේ ජනාධිපතිට බවත් අනාවරණය විය. හරස් ප්‍රශ්න ඇසීමක් ද සිදු විය.

**3. Any significant observations inside court room and outside? -** විශේෂ තත්වයක් නිරීක්ෂණය නොවීය

**4. Next date & time:** 2021/12/15 – 9.30 am

**5. Media reports about the case on this date:**

- “පාස්කු ප්‍රහාරය දා දේව මෙහෙය සිදුකළ පියතුමා අධිකරණයේදී දැඩිව හැඟුම්බරවෙයි – මතකයන් යළි මතක් කරන්න එපා විනිසුරු මඩුල්ල කියයි” (Newshub.lk, 14 December 2021) < පාස්කු ප්‍රහාරය දා දේව මෙහෙය සිදුකළ පියතුමා අධිකරණයේදී දැඩිව හැඟුම්බරවෙයි – මතකයන් යළි මතක් කරන්න එපා විනිසුරු මඩුල්ල කියයි | News Sri Lanka | Latest News Sri Lanka| Breaking News Sri Lanka| News Hub| Gossip Sri Lanka > accessed on 14th of December 2021
- “ අද දෙරණ 6.55 ප්‍රධාන පුවත් විකාශය - 2021.12.14 | Ada Derana Prime Time News Bulletin” (Ada Derana, 14 December 2021) <https://www.youtube.com/watch?v=ijnONpQ3GEI > accessed on 15th of December 2021(Time duration:27:01 – 28:50)
- “හිරු රාත්‍රී 6.55 ප්‍රධාන ප්‍රවෘත්ති ප්‍රකාශය - Hiru TV NEWS 6:55 PM Live | 2021-12-14” (Hiru News, 14 December 2021) < https://www.youtube.com/watch?v=vuqu0qlkgDI > accessed on 15th of December 2021 (Time duration: 39:08 – 41:30)
- “News 1st: Prime Time Sinhala News - 7 PM | (14/12/2021) රාත්‍රී 7.00 ප්‍රධාන ප්‍රවෘත්ති (Newsfirst Sri Lanka, 14 December 2021) < https://youtu.be/zBiokxAtjv4?t=1359 > accessed on 15th of December 2021 (Time duration: 22:38 – 24:24)
- “ආරක්ෂක මණ්ඩලයට හිටපු අගමැති එනවාට හිටපු ජනපති කැමැත්තක් දැක්වුවේ නෑ” (ලංකාදීප, 14 December 2021) <https://www.lankadeepa.lk/news/%E2%80%98%E2%80%98%E0%B6%86%E0%B6%BB%E0%B6%9A%E0%B7%8A%E0%B7%82%E0%B6%9A-%E0%B6%B8%E0%B6%AB%E0%B7%8A%E0%B6%A9%E0%B6%BD%E0%B6%BA%E0%B6%A7-%E0%B7%84%E0%B7%92%E0%B6%A7%E0%B6%B4%E0%B7%94-%E0%B6%85%E0%B6%9C%E0%B6%B8%E0%B7%90%E0%B6%AD%E0%B7%92-%E0%B6%91%E0%B6%B1%E0%B7%80%E0%B7%8F%E0%B6%A7-%E0%B7%84%E0%B7%92%E0%B6%A7%E0%B6%B4%E0%B7%94-%E0%B6%A2%E0%B6%B1%E0%B6%B4%E0%B6%AD%E0%B7%92-%E0%B6%9A%E0%B7%90%E0%B6%B8%E0%B7%90%E0%B6%AD%E0%B7%8A%E0%B6%AD%E0%B6%9A%E0%B7%8A-%E0%B6%AF%E0%B7%90%E0%B6%9A%E0%B7%8A%E0%B7%80%E0%B7%94%E0%B7%80%E0%B7%9A-%E0%B6%B1%E0%B7%91%E2%80%98%E2%80%98/101-604839 > accessed on 17th of December 2021


## Trial Monitoring report

**About the case:** Easter Attack case against former Defence Secretary

**Case no:** HC (TAB) 2899/21

**Courts:** Colombo High Court No. 4 Trial at Bar

**Date of hearing:** 15/12/2021

**Author (s) of report:** Centre for Society and Religion (CSR)

## 1. Who was in courts:

| Who | Names / other information | Comments |
|---|---|---|
| **Judge (s)** | Namal Balalle,Adithya Patabandige, Mohomad Isardeen | |
| **Attorney General's Dept.** | Additional solicitor general Sudarshana De Silva and others | |
| **Police (CID / TID etc.)** | | |
| **Accused / Suspects** | Hemasiri Fernando | |
| **Lawyers for accused / suspects** | Mohan Weerakoon, PC | |
| **Aggrieved party** | | |
| **Lawyers for aggrieved party** | | |
| **Supporters of accused / suspects** | | |
| **Supporters of aggrieved party** | | |
| **Others** | Journalists and others whose identity was not visible | |

## 2. What happened in court hearing?

- පැමිණිල්ලේ සාක්ෂිකරුවන් වන 3, 66, 1150 යන සාක්ෂිකරුවන් පිළිබඳ සඳහන් කිරීමක් සිදු විය.
- 2019 වර්ෂයට අදාළව ආරක්ෂක මණ්ඩල රැස්වීම් හා බුද්ධි සමාලෝචන රැස්වීම් පැවැත්වූ දින සම්බන්ධ දැක්වීමක් විය.
- පැමිණිල්ලේ සාක්ෂි අංක 3 (තුන්වන සාක්ෂිකරු) වන හිටපු ජාතික බුද්ධි ප්‍රධානී සිසිර මෙන්ඩිස් මහතා වෙනුවෙන් ජනාධිපති නීතිඥ ශානක රණසිංහ මහතා ඇතුළු නීතිඥ මඩුල්ලක් පෙනී සිටින ලදී. සාක්ෂිකරුගේ නීතිඥවරයා විසින් නීතිපති දෙපාර්තමේන්තුව වෙනුවෙන් පෙනීසිටි නීතිඥවරයාහට වෛද්‍ය වාර්තාවක් ඉදිරිපත් කර සිටියි. එම වෛද්‍ය වාර්තාවේ 3 වන ඡේදයේ දැක්වෙන රෝගී තත්ත්වය ප්‍රකාරව එම සාක්ෂිකරු සාක්ෂි ලබා දීමට සුදුසු කායික මානසික තත්වයක සිටින්නේද යන්න පිළිබඳ වෛද්‍ය වාර්තාවක් කැඳවන ලෙස පැමිණිල්ලේ නීතිඥවරයා විසින් අධිකරණයෙන් ඉල්ලා සිටින ලදී.
- විත්තියේ නීතිඥවරයා විසින් ප්‍රකාශ කරන ලද්දේ, තුන්වන සාක්ෂිකරු වෙනුවෙන් පෙනී සිටි ජනාධිපති නීතිඥ ශානක රණසිංහ ඇතුළු නීතිඥවරුන් 2019 වසරේ ඔක්තෝම්බර් මස 28 වන දින වෛද්‍ය වාර්තාවක් ඉදිරිපත් කර ඇති බවත්, එම වාර්තාවේ සාක්ෂිකරුගේ මානසික තත්ත්වය ගැන දක්වා නොමැති බවත්ය. එමෙන්ම ඔහු තවදුරටත් ප්‍රකාශ කර සිටියේ, සාක්ෂිකරු කැඳවීම,

නොකැඳවීම සොලිසිටර්ගේ තීරණය වන බවත්, මෙම සාක්ෂිකරු සාක්ෂි දීමට සූදානම් බවත්, සාක්ෂිකරුගේ වෛද්‍ය වාර්තාවක් නැවත කැඳවීම ඔහුට අගෞරවයක් බවත්ය.

- පැමිණිලි පාර්ශවයේ නීතිඥවරයා විසින් සාක්ෂි ආඥා පනතේ 118 වගන්තිය විනිසුරුවරයාගේ අවධානයට යොමු කරන ලදී. එහිදී එක් විනිසුරුවරයෙක් එම වගන්තියේ ඇත්තේ, " අධිකරණය කල්පනා කරතොත් මිස" යනුවෙන් දක්වා, සාක්ෂිකරු පැමිණි කල්හී අධිකරණයට තීරණය කළ හැකි බව දැක්විය. එමෙන්ම විනිසුරුවරයකු, තවදුරටත් දක්වන්නේ, සාක්ෂිකරුගේ නීතිඥවරයාත් සාක්ෂිකරුට සාක්ෂිදිය හැකි බව පවසනවානේ යන්නයි.
- තුන්වන සාක්ෂිකරුගේ නීතිඥවරයා කරුණු දක්වමින් ප්‍රකාශ කර සිටියේ, තුන්වන සාක්ෂිකරුගේ දැනට තිබෙන රෝගී තත්ත්වය පිළිබඳව ජනාධිපති කොමිෂන් සභාව වෙනුවෙන් පෙනී සිටියදී ඉහත සඳහන් කරන ලද වෛද්‍ය වාර්තාව ඉදිරිපත් කරන ලද බවත්, සාක්ෂිකරු පිටු හයසීයක පමණ සාක්ෂි ලබා දුන් බවත්, එහිදී ඔහුට සාක්ෂි දීමට පහසුවන ලෙස යම් යම් අවස්ථා වලදී කෙටි විවේකයන් අවශ්‍ය වූ විට ලබාදුන් බවත්ය. එමෙන්ම, විශේෂ ජනාධිපති කොමිෂන් සභාවේ සාක්ෂි දීමෙන් අනතුරුව දිගටම ප්‍රතිකාර ලබා ගන්නා ලද බවත් දැක්විය.
- අධිකරණයේ වැඩකටයුතු සුළු වේලාවකට කල් තබන ලදී.
- නැවත අධිකරණයේ වැඩකටයුතු ආරම්භ කළ අතර, විනිසුරු සාක්ෂි ආඥා පනතේ 118 වගන්තිය අධිකරණය හමුවේ කියවා සිටින ලදී. එම වගන්තිය මෙසේය " සියලු තැනැත්තන්, ලාබාළ වයස, අධික මහලු වයස, ශාරීරික හෝ මානසික අබාධ හෝ එම වර්ගයේ අන් කිසි හේතුවක් නිසා තමන්ගේ අසනු ලබන ප්‍රශ්න අවබෝධ කර ගැනීමට ද එකී ප්‍රශ්නවලට කල්පනාවෙන් පිළිතුරු සැපයීමට ද නොහැකි යයි අධිකරණය කල්පනා කරතොත් මිස, නො එසේ ව සාක්ෂි දීමට සුදුස්සන් විය යුතු ය." " **පැහැදිලි කිරීම -** තමාගේ උමතුව නිසා තමාගෙන් අසනු ලබන ප්‍රශ්න අවබෝධ කර ගැනීමට ද ඒවාට කල්පනාවෙන් පිළිතුරු සැපයීමට ද බාධා පැමිණෙතොත් මිස එසේ වූ විට උමතු අයත් සාක්ෂි දීමට නුසුදුසු නොවේ."[i]
- ඒ අනුව තුන්වන සාක්ෂිකරුව කැඳවනවා ද නැද්ද යන්න තීරණය කිරීමට පැමිණිලි පාර්ශවය කෙටි කාලයක්[ii] අයැද සිටින ලද විට එම ඉල්ලීමට එකඟ නොවන බව විනිසුරුවරයකු ප්‍රකාශ කරමින් සඳහන් කරන ලද්දේ, එම වෛද්‍ය වාර්තාව කැඳවීමට එකඟ නොවුනහොත් කරනු ලබන දේ පැමිණිල්ල තීරණය කර තිබිය යුතු බවයි. කෙසේ නමුත් පැමිණිලි පාර්ශවයට සාක්ෂිකරු කැඳවනවාද නැතිද යන්න තීරණය කිරීමට අධිකරණය විසින් කාලය ලබා දෙමින් දහවල් 12 දක්වා අධිකරණය කල් තබන ලදී.
- ඉන් අනතුරුව, තුන්වන සාක්ෂිකරු, පැමිණිල්ලේ සාක්ෂියට මේ අවස්ථාවේ නොකැඳවන බව පැමිණිල්ලේ නීතිඥවරයා ප්‍රකාශ කරන ලදී.

### 3. Any significant observations inside court room and outside? - විශේෂ තත්වයක් නිරීක්ෂණය නොවීය

### 4. Next date & time: 2022.01.18 – 1.30pm

### 5. Media reports about the case on this date:

- "අද දෙරණ 6.55 ප්‍රධාන පුවත් විකාශය - 2021.12.15 | Ada Derana Prime Time News Bulletin" (Ada derana, 15 December 2021) < https://youtu.be/IO52-czT5Y0?t=1570 > accessed on 16 December 2021 (Time duration: 26:08 – 26:27)
- "News 1st: Prime Time Sinhala News - 7 PM | (15/12/2021) රාත්‍රී 7.00 ප්‍රධාන ප්‍රවෘත්ති" (Newsfirst Sri Lanka, 15 December 2021) < https://youtu.be/LSc0eHUJbmE?t=1498 > accessed on 16 December 2021 (Time duration: 24:56 – 26:49)
- "හිරු රාත්‍රී 6.55 ප්‍රධාන ප්‍රවෘත්ති ප්‍රකාශය - Hiru TV NEWS 6:55 PM Live | 2021-12-15" (Hiru News, 15 December 2021) < https://youtu.be/y3C6VidEV_A?t=1839 > accessed on 16 December 2021 (Time duration:30:38 – 33:33)

- **“**පාස්කු ප්‍රහාර නඩුව: හමුදා බුද්ධි අංශ ප්‍රධානියාගේ විස්මිත සාක්ෂියෙන් පසු අනෙක් බුද්ධි ප්‍රධානීන් නවතයිද?” (Sri Lanka Brief, 15 December 2021) < https://sinhala.srilankabrief.org/?p=40138 > accessed on 16 December 2021

---

[i] සාක්ෂි ආඥා පනතෙන් උපුටා ගන්නා ලදී.

[ii] අයැද සිටියේ කෙටි කාලයක් ද දිනයක් ද යන්න පැහැදිලි නොවීය.